10-7

# බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය

**01.** සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : බස්නාහිර පළාත් අභ්‍යන්තර විගණන ඒකකය
යොමු අංකය : CSO/PTR/15/3/4
දිනය : 2014-11-24

1.2 අමාත්‍යාංශය : යොමු අංකය : -
දිනය : -

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම
යොමු අංකය : ඩීඑම්එස්/ඩී/පොදු/ 11-2
දිනය : 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්(බ.ප)ගේ නිර්දේශය : යොමු අංකය : CSO/PTR/15/3/4
දිනය : 2014-12-05

1.5 වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය
යොමු අංකය :
දිනය :

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය
: යොමු අංකය : 1/4/2/5/32
දිනය : 2015.03.18

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය : යොමු අංකය : 1/4/4/280
දිනය : 2015.05.06

**02.** පත්කිරීමේ බලධාරියා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ක්‍රියාත්මක වන දිනය : ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : ආශ්‍රිත නිලධාරි

3.2 ශ්‍රේණි : III, II හා I ශ්‍රේණිවලින් සමන්විත වේ.

3.3 පැවරෙන කාර්යයන් පිළිබඳ පොදු නිර්වචනය : කාර්යයන්හි ස්වභාවය අනුව තත් කාර්යයන් ඉටු කිරීම සඳහා ආයතනයේ විධායක නිලධාරීන්ගේ හා ආයතන ප්‍රධානීන්ගේ කාර්යයන්ට උපස්ථම්භක වන්නා වූ ද බස්නාහිර පළාත් සභාවට අයත් ආයතනයන්හි අභ්‍යන්තර පාලන ක්‍රම හා අභ්‍යන්තර සෝදිසි ක්‍රම නිවැරදිව පවත්වාගෙන යාම වැනි අභ්‍යන්තර විගණනයට අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා බඳවා ගැනීමේ දී පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් අවශ්‍ය වන්නා වූ ද කාර්ය භාරයක් පැවරෙන සේවා ගණයකි

අනුමත කරමි / නොකරමි
දිනය 6/7
කේ.සී. ලෝගේස්වරන්
ආණ්ඩුකාරවර
බස්නාහිර පළාත

106

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෝෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලැබිය හැකිය.

**04.** තනතුරේ ස්වභාවය : ස්ථිර ,විශ්‍රාම වැටුප් සහිත

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංකය : රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006 (IV) අනුව MN – 4 – 2006 A

5.2 වැටුප් පරිමාණය : 15,215/- 10 X 215 - 4 X 240 - 7 X 320 - 15 X 360 - 25,965/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | වැටුප් පියවර | වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 1 | රු. 15,215/- |
| II | පියවර 12 | රු. 17,605/- |
| I | පියවර 23 | රු. 20,925/- |

**06.** සේවා ගණයට අයත් තනතුර /තනතුරු

6.1 අනුමත තනතුරු නාම , අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| අභ්‍යන්තර විගණන නිලධාරි | III , II හා I | 25 | බස්නාහිර පළාත් සභාවට අයත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලය, සභා ලේකම් කාර්යාලය, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, ප්‍රධාන ලේකම් කාර්යාලය, සියලුම අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු, ප්‍රඥප්ති යටතේ පිහිටුවා ඇති මණ්ඩල, අධිකාරි, ආයතන හා අරමුදල් ද ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැනි පළාත් සභා කාර්යයන් පවරා ඇති පළාත් සභා නොවන කාර්යාල හා ආයතන සම්බන්ධයෙන් එසේ පවරා ඇති කාර්යයන් පිළිබඳව ද පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමය පිළිබඳ පරීක්ෂා කිරීමත් වැරදි හා වංචා වැලැක්වීමට අවශ්‍ය අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත්බව හෝ ප්‍රමාණවත්බව පිළිබඳව අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම |



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.
ගොනු අංකය : 1/4/4/980 දිනය : 2015.05.06

105

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව - 25
(උසස් කිරීමේ කාර්යය සඳහා III,II,I ශ්‍රේණි ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ.)

**07. බඳවා ගැනීමේ ක්‍රමය**

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | - |
| කුසලතා | - |

7.2 <u>විවෘත බඳවා ගැනීම</u>

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණය, වානිජ්‍ය, ආර්ථික විද්‍යාව, ගණිතය, රාජ්‍ය මූල්‍ය සහ බදුකරණය යන විෂයයන්ගෙන් එකක් හෝ කීපයක් ප්‍රධාන විෂයය වශයෙන් ඇතුළත් වූ උපාධියක් ලබා තිබීම

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ

7.2.2.3 පළපුරුද්ද : විගණනය පිළිබඳ වසර දෙකක (02) පළපුරුද්දක් ලබා තිබීම (වරලත් ගණකාධිකාරිවරයෙකු විසින් නිකුත් කළ ලිපියක් මගින් පළපුරුද්ද සනාථ කළ යුතුය)

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකු ම බස්නාහිර පළාතේ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමට සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

i. ශ්‍රී ලාංකිකයෙකු වීම
ii. යහපත් චරිතයකින් යුක්ත වීම
iii. අයදුම්පත් කැඳවන අවසන් දිනට බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ වසර තුනක ස්ථිර පදිංචිකරුවකු වීම
iv. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා සලකා බලන සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/4/4/280. දිනය : 2015.05.06

104

7.2.3 වයස
7.2.3.1 අවම සීමාව : අවුරුදු 22
7.2.3.2 උපරිම සීමාව : අවුරුදු 35
(දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ ස්ථිර නිලධාරීන් සඳහා මෙම උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා විවෘත තරග විභාගයක ප්‍රතිඵල මත කුසලතා අනුපිළිවෙළ අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගැනේ.

7.2.4.1 ලිඛිත විභාගය : විෂය නිර්දේශය ඇමුණුම අංක 01 හි දැක්වේ.

| විෂයයන් | | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| i. | ගණකාධිකරණය | 100 | 40% |
| ii. | විගණනය | 100 | 40% |
| iii. | වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම | 100 | 40% |

7.2.4.1.1 පවත්වන බලධරයා :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ එම කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් මෙම ලිඛිත පරීක්ෂණය පවත්වනු ලැබේ.

7.2.4.2 වෘත්තීය පරීක්ෂණ : අදාළ නොවේ.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ : ලකුණු ලබා දෙනු නොලැබේ
ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කර බැලීම සඳහා පමණක් මෙය පවත්වනු ලැබේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා :
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ / ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මගින්.

**7.3 සීමිත බඳවා ගැනීම** : අදාළ නොවේ.

**7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම** : අදාළ නොවේ.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/1/980 දිනය 2015.05.06

08. කාර්යක්ෂමතා කඩඉම්

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉම ද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට පත් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 02) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර තුන (03) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 03) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර පහ (05) ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 04) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක් ද?
වර්ෂයකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද?

1 වන කාර්යක්ෂමතා කඩඉම :
2 වන කාර්යක්ෂමතා කඩඉම :
3 වන කාර්යක්ෂමතා කඩඉම :

} බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරන ලද ආයතනයක් විසින්

09. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|---|
| 1. | රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| 2. | දෙවන භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. | සන්ධාන භාෂාව | අදාළ නොවේ. |

10. ශ්‍රේණි උසස් කිරීම

10.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම :

10.1.1 සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. පත්වීම ස්ථිර කර තිබීම.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/280 දිනය : 2015.05.0

ii. නිලධර ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ යෙදුණු සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 10 ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස්වීම් දිනට පූර්වාසන්නතම වසර 05 තුළ ම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබාගෙන තිබීම.

vi. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීමට නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම 05) මගින් පත්කිරීමේ බලධරයා වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව III ශ්‍රේණියේ වසර 10 සම්පූර්ණ කරන දිනය හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දින යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීමේ බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.1.2 සුවිශේෂී කාර්යසාධනය අනුව උසස් කිරීම : අදාළ නොවේ.

10.2 <u>II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම</u>

10.2.1 සාමාන්‍ය කාර්ය සාධනය අනුව උසස් කිරීම

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්

i. නිලධර ගණයෙහි II ශ්‍රේණියේ වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ යෙදුණු සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

ii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර 10 ක් තුළ සාමාන්‍ය මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. උසස්වීම් දිනට පූර්වාසන්න වසර 05 තුළ ම සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

iv. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.



ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/280 දිනය : 2015.05.06

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමට නියමිත ආකෘතිය (ඇමුණුම 05) මගින් පත්කිරීමේ බලධාරියා වෙත අදාළ නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට සුදුසුකම් පරීක්‍ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් සපුරාලන දිනය හෝ II ශ්‍රේණියේ වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දින සිට I ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීමේ බලධාරියා විසින් සිදු කරනු ලැබේ.

10.2.2 සුවිශේෂී කාර්ය සාධනය අනුව උසස් කිරීම : අදාළ නොවේ.

10.3 <u>I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u> : අදාළ නොවේ.

**11. තනතුරුවලට පත් කිරීම : අදාළ නොවේ.**

**12. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නා වූ කොන්දේසි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද ,බස්නාහිර පළාත් සභා මූල්‍ය රීතිවලට ද කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**13. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ කිසිවක් වේනොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

**14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : අදාළ නොවේ.**

**15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.**

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/220.. දිනය : 2015/05/06

**16.** අර්ථ නිරූපණ

| | |
|---|---|
| <u>සතුටුදායක සේවා කාලය</u> | (i) පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු විසින් කාර්යක්‍ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්‍ෂමතා කඩඉම් සමත්වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.<br><br>(ii) නිල්ධාරියා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමුවැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටෙක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටෙක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය. |
| <u>සක්‍රිය සේවා කාලය</u> | සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයෙන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය. |
| <u>නියමිත දිනට</u> | අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය. 'නියමිත දිනය' ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධාරින්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය |

සකස් කළේ : අත්සන ..............................  පරීක්‍ෂා කළේ : ..............................
(විෂයභාර මාණ්ඩලික නිලධාරියා)

එස්. එම්. එච්. කුසුමසිරි
පරිපාලන නිළධාරී (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් කාර්යාලය
බස්නාහිර පළාත් සභාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොණු අංකය : 1/4/2/80 දිනය : 2015.05.06

99

නිර්දේශ කර ඉදිරිපත් කරමි

දිනය 2014/11/28

අත්සන .................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම
තනතුර
නිල මුද්‍රාව

චම්පිකා පතිරණ
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,
බස්නාහිර පළාත් සභාව.

යොමු අංකය: CSO/PTR/15/3/4

බස්නාහිර පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

දිනය 2014-12-05

අත්සන : .................................
නම : .................................
ප්‍රධාන ලේකම් (බ.ප.)
නිල මුද්‍රාව

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

යොමු අංකය: 1/4/2/5/32

බස්නාහිර පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කර ඇත.

දිනය 2015.03.18

අත්සන : .................................
නම : .................................
ලේකම්
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නිල මුද්‍රාව

වී. රාජපක්ෂ
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත

යොමු අංකය: 1/4/4/280

බස්නාහිර පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ....2015.05.06...දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

දිනය 2015.05.06

අත්සන : .................................
නම : .................................
ආණ්ඩුකාර ලේකම්

සුනිල් අබේවර්ධන
බ. ප. ආණ්ඩු[illegible] ලේකම්

නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය: 1/4/4/280 දිනය: 2015.05.06

ඇමුණුම : 01

**<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුරට (විවෘත) බඳවා ගැනීම සඳහා වන තරග විභාගය පිළිබඳ විස්තර</u>**

1. විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුරට (විවෘත) බඳවා ගැනීම සඳහා වන තරග විභාගය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ගණකාධිකරණය | පැය 03 | 100 | 40% |
| විගණනය | පැය 03 | 100 | 40% |
| වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම | පැය 03 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධාරියා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරන ලද ආයතනයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : පුරප්පාඩු ඇතිවන අවස්ථාවන්හිදි අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගණකාධිකරණය | ගණකාධිකරණය න්‍යාය, මූලික සංකල්ප හා මූලධර්ම ,වත්කම් ඇගයීමේ ක්‍රම, ද්විත්ව සටහන් න්‍යාය, පිරිවැය වර්ගීකරණය, ශේෂපත්‍රවල තොරතුරු වර්ගීකරණය ,නිෂ්පාදන, වෙළෙඳ හා ලාභාලාභ ගිණුම් පිළිබඳ සාමාන්‍ය අවබෝධය |
| | ගණකාධිකරණ පද්ධති - ගිණුම් ඒකකයක උපයෝගී කර ගනු ලබන සම්පත්වල වෙනස්වීම් පාලනය කිරීමේ අවශ්‍යතාව පදනම් කර ගත් පාලන සංකල්ප පිළිබඳ අවබෝධය, ප්‍රමිතයන් සමඟ සැසඳීමේ අවශ්‍යතාව, ව්‍යාපාරික ගනුදෙනු විශ්ලේෂණය, මිල දී ගැනීම් , වෙළෙඳාම, මුදල් ලැබීම් හා ගෙවීම් , ඉන්වෙන්ට්‍රි පාලනය ආදි මූලික කළමනාකාරිත්වය, කාර්යභාරයන්ට අදාළ පරිපාටි නිපුණතාවය, දෛනික පොත්, ලෙජර් පාලන ගිණුම් ආදි වාර්තා සැලසුම් ආකෘති පිළිබඳ නිපුණත්වය |
| | ශේෂපත්‍ර සකස් කිරීම ,නිෂ්පාදන, වෙළෙඳ හා ලාභාලාභ ගිණුම්, ආදායම් හා වියදම් ගිණුම්, සැසඳුම් ප්‍රකාශ, පාලන ගිණුම්, ගණක හා සංඛ්‍යාත අනුපාතයන් තනි සටහන් හා අසම්පූර්ණ වාර්තා ආදිය ඇතුළත් ගණකාධිකරණ ව්‍යවහාරයේ ගැටලු |
| විගණනය | විගණන සංකල්ප හා න්‍යාය<br>විගණනයේ අවශ්‍යතාව, ගණන් දීමේ වගකීම ,විගණනයේ පදනම, විගණනයේ විෂය පථය, විගණන වර්ග, විගණන කාල නිර්ණය, විගණකවරුන්ගේ අභ්‍යන්තර පාලනය, අභ්‍යන්තර විගණනය, ප්‍රමිත සඳහා වන අවශ්‍යතාව , විගණනය සාක්ෂි වර්ග ශිල්පීය ක්‍රම |
| | විගණන පද්ධති හා පරිපාටි<br>ප්‍රධාන ශේෂ පත්‍රය, නිෂ්පාදන වෙළෙඳ හා ලාභාලාභ ගිණුම් විෂයයන්, ඉඩම්, ගොඩනැගිලි ,ස්ථාවර වත්කම්, ඉන්වෙන්ට්‍රි මුදල්මය වත්කම්, විකුණුම් මිල දී ගැනීම්, ලැබීම්, ගෙවීම් ආදිය ආවරණය වන විගණන වැඩසටහන් පිළිබඳ නිපුණත්වය |
| | විගණන ගැටලු නිරීක්ෂණ හැකියාවන් හා වැරදි , අසාමාන්‍ය අවස්ථාවන් සොයා බැලීමේ හැකියාව පිරික්සීම සඳහා වන සරල ගැටලු |
| | විගණකාධිපතිවරයාගේ කාර්යයන් |
| වාර්තා ලිවීම හා කළමනාකරණය වෙත තොරතුරු ඉදිරිපත් කිරීම | ආශ්‍රය තොරතුරු පරිහරණය, රැස්වීම් වාර්තා හා සටහන් ලිවීම, ප්‍රතිඵල අර්ථකථනය, විචල්‍යයන් යෝජනා කිරීම, දත්ත විශ්ලේෂණයේ දී සංඛ්‍යා නාම ක්‍රම භාවිතය, කාර්ය සාධනය සැසඳීම, කළමනාකරණ වාර්තා වල අනුපාත හා ප්‍රතිශත භාවිතය |

අත්සන ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානී)
නම ..........................................
තනතුර ..........................................
දිනය ..........................................
නිල මුද්‍රාව ..........................................

චම්පිකා පතිරණ
අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,
බස්නාහිර පළාත් සභාව

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/280 දිනය : 2015.05.06

ඇමුණුම : 02

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පිළිබඳ විස්තර**

1. විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ගණකාධිකරණය | පැය 03 | 100 | 40% |
| විගණනය | පැය 03 | 100 | 40% |
| මුදල් රෙගුලාසි හා මූල්‍ය කාර්ය පරිපාටිය | පැය 03 | 100 | 40% |
| පරිපාලනය හා නීතිය | පැය 03 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධාරියා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරන ලද ආයතනයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ගණකාධිකරණය | ගිණුම් තැබීමේ ප්‍රකාශවල සීමාවන්, ගිණුම් වර්ගීකරණය, වත්කම් ඇගයීම ඇතුළු පොදු සංකල්ප, භාණ්ඩාගාර ගිණුම් ,රාජ්‍ය ගිණුම්, රාජ්‍ය ආදායම් ගිණුම්, විසර්ජන ගිණුම්, අත්තිකාරම් ගිණුම්, විදේශ ආධාර ගිණුම් තැබීම (පළාත් සභා ද ඇතුළුව) , රාජ්‍ය සංස්ථාවල සහ පළාත් පාලන ආයතනවල ගිණුම්, ගිණුම් හා සංඛ්‍යාත අනුපාතයන්, වැඩසටහන් අයවැය, රජයේ/පළාත් සභා ඇස්තමේන්තු ස්වරූපය, ව්‍යාපෘති ඇගයුම, ද්‍රව්‍ය,ශ්‍රම හා පොදුකාර්ය පිරිවැයකරණය ආදි ක්ෂේත්‍ර ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. |
| විගණනය | ගණන් දීමේ වගකීම, විගණනයේ අවශ්‍යතාව, විගණන විෂය පථය ඇතුළු පොදු සංකල්ප, විගණකාධිපති කාර්යයන්, මූල්‍ය විගණනය, සකසුරුවම්කම, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය පිළිබඳ විගණනය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතන මගින් නිකුත් කරන ලද විගණන ප්‍රමිතීන්, ගනුදෙනු ,වත්කම්, බැරකම් පිළිබඳ විගණනය, විකුණුම්, මිලදී ගැනීම් ,මුදල් ලැබීම්, ගෙවීම්, ඉන්වෙන්ට්‍රි පාලනය හා සම්බන්ධ පද්ධති, රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, රජයට පවරා ගත් ව්‍යාපාරික කටයුතු සහ පළාත් පාලන ආයතන පිළිබඳ විගණනයේ ප්‍රමුඛ ලක්ෂණ, අත්තිකාරම් ගිණුම් හා අරමුදල් විගණනය, විගණන වාර්තා ආකෘති, අභ්‍යන්තර විගණනයෙන් ඉටු වන කාර්යභාරය, රාජ්‍ය පළාත් සභා ගිණුම් කාරක සභාවෙන් සහ රාජ්‍ය ව්‍යවසායන් පිළිබඳ කමිටුවෙන් ඉටු වන කාර්යභාරය, භාණ්ඩාගාර සටහන් ආදි ක්ෂේත්‍ර ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි |
| මුදල් රෙගුලාසි හා මූල්‍ය කාර්ය පරිපාටිය | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූල්‍ය විධිවිධාන, පළාත් පාලන මූල්‍ය කාර්ය පරිපාටිය, 1971 අංක 38 දරණ මුදල් පනත (II කොටස) , රජයේ මුදල් රෙගුලාසි, පළාත් සභා මූල්‍ය රීති, ගබඩා හා ටෙන්ඩර්, අග්‍රිම හා අත්තිකාරම් |
| පරිපාලනය හා නීතිය | ආයතන සංග්‍රහයේ I හා II කොටස්, කාර්යාල සංවිධාන හා ක්‍රම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පළාත් සභා පනත, පළාත් පාලන ආයතන පිළිබඳ පනත්, ප්‍රාදේශීය සභා පනත ,පළාත් සභාවේ විවිධ ප්‍රඥප්ති ආදි පිළිබඳ අවබෝධය |

අත්සන ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම .............. චම්පිකා පතිරණ

තනතුර .............. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව, බස්නාහිර පළාත් සභාව

දිනය ..............................

නිල මුද්‍රාව ..............................

ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/4/280 දිනය : 2015.05.06

ඇමුණුම : 03

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පිළිබඳ විස්තර

1. විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| කළමනාකරණ ගණකාධිකරණය | පැය 03 | 100 | 40% |
| රාජ්‍ය රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | පැය 03 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධාරියා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරන ලද ආයතනයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| කළමනාකරණ ගණකාධිකරණය | අයවැය ලේඛන සම්පාදනය කිරීමේ සංකල්ප, අයවැය පාලනය, ප්‍රධාන හා අතුරු අයවැය, අයවැය කළමනාකරණයෙහි ලා කළමනාකරණ සහභාගීත්වය මැදිහත් වීම සහ අභිප්‍රේරණය, අයවැය කාලසීමාව සහ ප්‍රධාන අයවැය සාධක හඳුනා ගැනීම පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය | රාජ්‍ය මූල්‍ය පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නෛතික රාමුව, ආයතනික රාමුව, පාර්ලිමේන්තුවේ පාලනය, මහා භාණ්ඩාගාරයේ කාර්යයන්, ඇස්තමේන්තු කාරක සභාව, විගණකාධිපති, රාජ්‍ය ගිණුම් කාරක සභාව, ඒකාබද්ධ අරමුදල ආදිය සම්බන්ධ දැනුම පරීක්ෂා කෙරේ. |

අත්සන ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධානී)

නම ....චම්පිකා පතිරණ....

තනතුර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)

දිනය ...අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,

නිල මුද්‍රාව බස්නාහිර පළාත් සභාව.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/280 දිනය : 2015.05.06

95

ඇමුණුම : 04

<u>බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ආශ්‍රිත නිලධාරි සේවා ගණයේ</u>
<u>අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වන</u>
<u>3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය පිළිබඳ විස්තර</u>

1. විභාගයේ නම : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් අභ්‍යන්තර විගණන ඒකකයේ ආශ්‍රිත නිලධාරි ගණයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුර සඳහා වන 3 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය

2. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| විගණනය | පැය 03 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධාරියා : බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ බලය පවරන ලද ආයතනයක් විසින්

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක් ද යන වග : වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි

5. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විගණනය | විගණනය සැලසුම් කිරීම, කාල නිර්ණය, අන්තර් හා අවසාන විගණනය, කාර්යයන් සඳහා වන වගකීම භාර දීම, විගණනය පාලනය, අභ්‍යන්තර පාලනය යොදා ගැනීම ඇතුළුව කළ වැඩසටහන්ගත කිරීම, සකස් කළ ප්‍රශ්න මාලා හා අභ්‍යන්තර පාලනය ඇගයීමේ ආකෘති පත්‍ර, මූල්‍ය විගණනය සඳහා අගයන් , සංකල්ප හා ලක්ෂණ එය රාජ්‍ය අංශයට අදාළ බව, විශ්ලේෂණාත්මක විගණනය, විගණකගේ වෘත්තීයමය වගකීම යන ක්ෂේත්‍ර සම්බන්ධ දැනුම පරීක්ෂා කෙරේ. |

අත්සන ..........................................
(දෙපාර්තමේන්තු ප්‍රධානි)

නම .......... චම්පිකා පතිරණ
තනතුර .......... අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව,
දිනය .......... බස්නාහිර පළාත් සභාව.
නිල මුද්‍රාව ..........................................

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
මණ්ඩල අංකය : 1/4/4/280 දිනය : 2015.05.06

94

ඇමුණුම : 05

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ අභ්‍යන්තර විගණන ඒකකයේ අභ්‍යන්තර විගණන නිලධාරි තනතුරේ ශ්‍රේණි උසස්වීම් ලබාගැනීම සඳහා වූ අයදුම්පත

1. නිලධරයා පිළිබඳ තොරතුරු

   1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..................................................................

   1.2 හැඳුනුම්පත් අංකය : ..................................................................

   1.3 සේවා ස්ථානය සහ එහි ලිපිනය : ..................................................................

   1.4 අයත් වන සේවය හා තනතුර : ..................................................................

   1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..................................................................

2. පත්වීම පිළිබඳ තොරතුරු

   2.1 පත්වීම් දිනය : ..................................................................

   2.2 පත්වීම ස්ථිර කළ දිනය : ..................................................................

   2.3 සමත් වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය :

| සමත් වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |
| | | |

   2.4 සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම හා සමත් දිනය :

| සමත් වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත් වූ දිනය |
|---|---|---|
| | | |

3. උසස්වීමට අදාළ තොරතුරු

   3.1 උසස්වීමට අපේක්ෂිත ශ්‍රේණිය : II / I

   3.2 උසස්වීමට අපේක්ෂිත ධාරාව : සාමාන්‍ය

   3.3.1 අවශ්‍ය සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත

   3.3.2 සක්‍රීය සේවා කාලය සම්පූර්ණ කළ දිනය ..........................................

   3.3.3 අපේක්ෂිත සක්‍රීය සේවා කාලය තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට අදාළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම්කර තිබේද? ඔව් / නැත

   3.3.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව් /නැත
   උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව් / නැත



ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද.
ගොනු අංකය : 1/5/4/280 දිනය : 2015.05.06

3.3.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව් / නැත

4. <u>අයදුම්කරුගේ ප්‍රකාශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ............................ දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ II / I ශ්‍රේණියට උසස් වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

දිනය : ............................................ ..................................................................

නිලධරයාගේ අත්සන

5. <u>දෙපාර්තමේන්තු ප්‍රධානිගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ,ඉහත නම් සඳහන් ............................................... මහතා / මිය / මෙනවිය .............................. සේවා ගණයේ ............................ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත්, සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම නිලධරයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................................

නිල මුද්‍රාව :

6. <u>ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්,ඒ අනුව ............................................................... මහතා / මිය / මෙනවිය .............................. සේවා ගණයේ ............................ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ .............................. දින සිට උසස් කිරීම නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................................

නිල මුද්‍රාව :